රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 02/2018 (I)

මගේ අංකය : MPA/HRD/ADMIN/Circular/01/2023

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2023.11.30

අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන් / දිසාපතිවරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතන වල සභාපතිවරුන්

## රාජ්‍ය අංශය තුළ මානව සම්පත් සංවර්ධනය කිරීම

උක්ත මැයෙන් 2018.01.24 දිනැතිව නිකුත් කරන ලද අංක 02/2018 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අමතර වශයෙනි.

02. අංක 2289/43 හා 2022/07/22 දිනැතිව ප්‍රකාශයට පත් කරන ලද අති විශේෂ ගැසට් පත්‍රය මඟින් රාජ්‍ය සේවා පුහුණු සම්බන්ධ කාර්යභාරය මෙම අමාත්‍යාංශයේ විෂය පථයට ඇතුලත් කර ඇත. ඒ අනුව, මහජනතාව වෙත උසස් සේවාවක් සැපයීමේ අරමුණින් සියලු රාජ්‍ය සේවාවන්හි පූර්ණ ධාරිතා සංවර්ධනයක් ඇති කිරීම සඳහා විශේෂ අවධානයක් යොමුකිරීම අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා ජනතා කේන්ද්‍රීය රාජ්‍ය සේවයක් සැපයීමත්, රාජ්‍ය සේවයේ ඵලදායීතාවය හා කාර්යක්ෂමතාව ඉහළ නැංවීමත් යන අරමුණු පෙරදැරිව වෘත්තීය සංවර්ධනය ද ඇතුළත්ව සියළු රාජ්‍ය ආයතනයන්හි දීර්ඝ කාලීන මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කිරීමේ අවශ්‍යතාවයත්, එහි වැදගත්කම හා එවැනි සැලැස්මක ඇති ඵලප්‍රයෝජන පිළිබඳවත් නැවත අවධානය යොමුකරමි.

03. රාජ්‍ය සේවයේ සියළුම මාණ්ඩලික හා මාණ්ඩලික නොවන නිලධාරීන්ගේ කාර්ය සාධන ඇගයීම් සම්බන්ධව පිළිවෙලින් 1998/03/13, 1998/04/30 හා 1998/12/11 දිනැතිව නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/98, 08/98 (i) හා 08/98 (ii) මගින් හඳුන්වා දී ඇති කාර්යය සාධන ඇගයීම් සඳහා භාවිතා කළ යුතු ආකෘති පත්‍ර තවදුරටත් අර්ථපූර්ණ ලෙස යොදාගන්නා ලෙස මින් අවධාරණය කරනු ලැබේ. ඒ අනුව, උක්ත කාර්ය සාධන ඇගයීම් වාර්ථා මගින් නිලධාරීන්ගේ පුහුණු අවශ්‍යතා හඳුනා ගෙන, එම අවශ්‍යතා සපුරාලීම සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා එමගින් ඔවුන්ගේ කාර්යය සාධනය ඉහළ නැංවීම අපේක්ෂා කෙරේ. ඒ සඳහා ඔබගේ ආයතනය තුළ මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කිරීමට මෙමගින් මග පෙන්වනු ලබන අතර ඒ වෙනුවෙන් සකස් කරන ලද මාර්ගෝපදේශය මෙහි උපලේඛනය මගින් දක්වා ඇත. ඒ අනුව, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 හි (1) ඡේදය මින් සංශෝධනය කරනු ලබන අතර ඒ අනුව එම චක්‍රලේඛයේ සඳහන් පරිදි "වාර්ෂික කාර්ය සාධන ගිවිසුම්" අත්සන් කිරීම තවදුරටත් අවශ්‍ය නොවේ.

04. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 හි ඡේද අංක 02 සිට 06 දක්වා වූ කරුණු තව දුරටත් වලංගු වන අතර එම කරුණු වඩාත් තහවුරු කිරීම සඳහා අවශ්‍ය උපදෙස් මෙහි උපලේඛනයේ ඇතුලත් මාර්ගෝපදේශය මගින් ලබාදෙනු ලැබේ. ඒ අනුව, ඔබ ආයතනයට අදාළ මානව සම්පත් සංවර්ධන සැලැස්ම සැකසීමේදී ඒ සඳහා උපයෝගී කරගත හැකිවන පරිදි එහි මෘදු පිටපත මෙම අමාත්‍යාංශ වෙබ් අඩවියෙහි මානව සම්පත් සංවර්ධන අංශයේ වෙබ් පිටුවෙහි පළකර ඇත. මේ සම්බන්ධයෙන් වැඩිදුර පැහැදිලිකර ගැනීම් අවශ්‍ය නම් දුරකථන අංක 011 2694041 මගින් මෙම අමාත්‍යාංශයේ මානව සම්පත් සංවර්ධන අංශය සම්බන්ධ කරගත හැකි බවද සඳහන් කරමි.

කේ.ඩී.එන්. රංජිත් අසෝක
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන
අමාත්‍යාංශය

පිටපත් :

| | | |
|---|---|---|
| 01. | ජනාධිපති ලේකම් | - කරු. අ.ක.ස. |
| 02. | අග්‍රාමාත්‍ය ලේකම් | - කරු. අ.ක.ස. |
| 03. | අමාත්‍ය මණ්ඩල ලේකම් | - කරු. අ.ක.ස. |
| 04. | විගණකාධිපති | - කරු. අ.ක.ස. |